යම් කිසි අපරාධයක් වාර්තා කිරීමේදී එයට භාවාතිශය වර්ණයන් ලබා නොදීම යෝග්‍ය වන්නේ, එම අපරාධය පිළිබඳ පුවත් වාර්තාව ඔස්සේ එහි ඇති සැබෑ බරපතළ බව පාඨකයාට අවබෝධ කරගැනීමට අවකාශයක් ලබා දිය යුතු නිසායි. නමුත් ඇතැම් පුවත් වාර්තාවන්, ඉන් පිට පනින අවස්ථාවන් ද දක්නට ලැබේ.

ඉරිදා මව්බිම (සැප්.18, 2022) පුවත්පත තුළ, "බලෙන් රියක දමාගෙන උල් පිහියක් පෙන්නලා තිදරු මව පැහැරගත් උමතු පෙම්වතා" යන සිරස්තලය සමගින් පළවී තිබූ ලිපිය ඊට නිදසුනකි. සිරස්තලයට අමතරව, එම ලිපිය තුළ භාවාතිශය ආකාරයෙන් දැක්වී තිබූ සඳහන් කිරීම් මෙසේ දැක්විය හැක.

"ඇයට දුරකථන ඇමතුමක් පැමිණි විටදී පවා වසන්ත ඇය ගැන බැලුවේ සැකයකිනි. ඇය කිසිවෙකු සමඟ කතාබස් කරනවාටද වසන්ත කැමැත්තක් දැක්වූයේ නැත. ඒ වසන්ත උමේෂාට දැඩි ලෙස ආදරය කළ නිසා වන්නට ඇත. ඒ තරම් ඔහු ඇයට පෙමින් බැඳී සිටියේය."

"මම හිතුවා පොලිසියෙන් ඇවිත් මෙයාව අරගෙන යයි කියලා. ඒ නිසා එයාවත් මරලා මාත් මැරෙන්න හිටියේ සර්, ඔහු ස්ථානාධිපතිවරයා හමුවේ කියන්නට විය. වසන්ත කෙතරම් උමේෂාට ආදරය කළේද යන්න ඉන් පැහැදිලි විය."

"සර්, ගෑනි මාත් එක්ක ආවේ නැත්නම් මම ඕකිව මරන එක මරනවාමයි. ඔහුගේ කතාවෙන් සැරයන්වරයාගේ දෙනෙත්ද උඩ ගියේය. මූ ඒ තරම් මේකිට ආදරෙයි, ඒකයි ඒ. ස්ථානාධිපතිවරයා සැරයන්වරයා ඉදිරියේ මුමුණන්නට විය."

1) ඉහත ආකාරයේ සඳහන් කිරීම් තුළින්, යමෙකු පසුපස උමතුවෙන් මෙන් ලුහුබැඳයෑමේ මනෝභාවයන් ඔස්සේ සිදුවන ප්‍රචණ්ඩත්වයන් සහ මෙවැනි අපරාධයන්, "ආදරයේ/ප්‍රේමයේ නාමයෙන් පෙම්වතෙකු විසින් සිදුකළ ක්‍රියාවකට" සමාන කොට නොදැක්වෙන්නේ ද?

2) ඒ ඔස්සේ, මෙවැනි අපරාධ -විශේෂයෙන්ම කාන්තාවන්ට එරෙහිව මුදාහැරෙන ප්‍රචණ්ඩ ක්‍රියා- ප්‍රේමය නිසා සිදුවන්නේ යැයි, සැහැල්ලු ලෙසින් සමාජයට සන්නිවේදනය වීමත්, ඉන් කාන්තාවන්ට එරෙහිව සිදුවන අපරාධ සාමාන්‍යකරණයට රුකුලක් ලැබීමත් සිදු නොවනු ඇතිද?